2025 දෙසැම්බර් 26

අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

ජනාධිපති ලේකම් කායර්ාලය

කොළඹ 01

අතිගරු ජනාධිපතිතුමනි,

<u>රාජ්‍ය ආයතන අවභාවිත කරමින් මාධ්‍ය නිදහස මදර්නය කිරීම</u>

ස්වාධීන මාධ්‍ය මදර්නය කිරීම සඳහා රජය ගෙන යන වේගවත් වැඩපිළිවෙළ සම්බන්ධයෙන් සවර්ජන බලය පක්ෂයේ දැඩි විරෝධය නිල වශයෙන් දක්වා සිටීම සඳහා පක්ෂයේ මහ ලේකම්වරයා ලෙස මෙම නිවේදනය නිකුත් කරමි. මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය ආයතනවලට බලපෑම් කිරීම සඳහා පොලිසිය, නියාමන බලධාරීන් සහ පරිපාලන යාන්ත්‍රණය දිගින් දිගටම භාවිත කිරීම ප්‍රජාතන්ත්‍රවාදී රටක කිසිසේත්ම පිළිගත නොහැක්කකි. මෙම රටාව දිගින් දිගටම පවත්වාගෙන යාමට ඉඩ දුන්නහොත්, එය මහජන විශ්වාසයට මෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිරූපයට ද පියවිය නොහැකි හානියක් සිදු කරනු ඇත.

පසුගිය මාස කිහිපය තුළ මාධ්‍ය වෙත එල්ල වන බාධාවන්හි සැලකිය යුතු වධර්නයක් දක්නට ලැබේ: මාධ්‍යවේදීන්ගේ වාතර්ාකරණය සම්බන්ධයෙන් ඔවුන් කැඳවා ප්‍රශ්න කිරීම, විකාශන ආයතන වෙත නියාමන තජර්න එල්ල කිරීම සහ භීතිය ඇති කිරීමට පොලිස් ක්‍රියාමාගර් භාවිතා කිරීම ඉන් කිහිපයකි. මෙම වධර්නයන් සාමාන්‍ය තත්ත්වයන් ලෙස සැලකිය නොහැක. ඒවා රජයක ප්‍රජාතන්ත්‍රවාදී වගකීම්වලට සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ ව්‍යවස්ථාපිත පොරොන්දුවට පටහැනි වේ.

හිරු රූපවාහිනී නාලිකාවට එරෙහිව පොලිසිය විසින් පවරන ලද පැමිණිල්ල සහ එහි වාතර්ාකරණයට අදාළව ගනු ලැබූ පියවර මෙහිදී විශේෂ අවධානයට ලක්විය යුතුය. අදාළ වාතර්ාකරණයේ විෂය කරුණ



නීතිඥ දිලිත් ජයවීර පා. ම.
නායක

ආචාර්ය හේමකුමාර නානායක්කාර
ජ්‍යෙෂ්ඨ නායක

රොෂාන් රණසිංහ
සභාපති

නීතිඥ රන්ජන් සෙනෙවිරත්න
මහ ලේකම්

ආචාර්ය චන්න ජයසුමන
උප සභාපති

අනුරාධා යහම්පත්
උප සභාපති

ගාමිණී වලේබොඩ
උප සභාපති

දිලුම් අමුණුගම
ජාතික සංවිධායක

අංක 11, පාර්ක් ඇවනිව්, කොළඹ 08, ශ්‍රී ලංකාව. இல.11, பார்க் அவென்யூ, கொழும்பு 08, இலங்கை. No. 11, Park Avenue, Colombo 08, Sri Lanka.
+94 11 7 344 321 +94 770 139 139 connect@sarvajanabalaya.com

කුමක් වුවත්, ප්‍රජාතන්ත්‍රවාදී රටක නිසි ප්‍රතිචාරය විය යුත්තේ විනිවිදභාවයකින් යුත් නීතිමය ක්‍රියාදාමයක් අනුගමනය කිරීම මිස, බිය ගැන්වීම හෝ නීත්‍යානුකූල මාධ්‍යකරණය අඩපණ කරන ආකාරයේ දඬුවම් සහ පීඩනයන් එල්ල කිරීම නොවේ.

පොලිසිය, නියාමන ආයතන සහ පරිපාලන යන්ත්‍රණය යොදාගනිමින් විවේචන මදර්නය කරන රජයක් කිසිලෙසකත් මහජනතාව ආරක්ෂා කරන්නේ නැත. එවැනි රජයක් ආරක්ෂා කරගන්නේ තමන්වමය. මෙහි ප්‍රතිවිපාක බරපතළය — මාධ්‍ය ස්වයං-සංශෝධනයකට ලක්වීම, මහජන විශ්වාසය පළුදු වීම සහ ප්‍රජාතන්ත්‍රවාදී නීත්‍යානුකූලභාවය ක්‍රමයෙන් පිරිහීම ඉන් කිහිපයකි. පුවත්පත් කලාව අපරාධයක් ලෙසත්, විරුද්ධත්වය පැම ද්‍රෝහිකමක් ලෙසත් සලකන සංස්කෘතියකට ඇද වැටීමට ශ්‍රී ලංකාවට නොහැකිය.

එබැවින් පහත සඳහන් කරුණු සහතික කිරීම සඳහා වහාම නිවැරදි ක්‍රියාමාගර් ගන්නා ලෙස සවර්ජන බලය ඔබ තුමන් ගෙන් ඉල්ලා සිටී:

- පයෙර්ෂණාත්මක වාතර්ාකරණය සහ පොදු කටයුතු පිළිබඳ විවේචන ඇතුළු නීත්‍යානුකූල වෘත්තීය කටයුතුවල නිරත වන කිසිදු මාධ්‍යවේදියෙකු හෝ මාධ්‍ය සේවකයෙකු හිරිහැරයට, තජර්නයට හෝ බිය ගැන්වීමට ලක් නොවිය යුතුය.

- පොලිසිය සහ අනෙකුත් රාජ්‍ය ආයතන දේශපාලන මෙහෙයවීම්වලින් තොරව දැඩි ලෙස නීතියට අනුකූලව කටයුතු කළ යුතු අතර, වාතර්ාකරණය අධෛයර්මත් කිරීමේ මෙවලමක් ලෙස කැඳවීම්, ප්‍රශ්න කිරීම් සහ පැමිණිලි භාවිතා කිරීම නැවැත්විය යුතුය.

- නියාමන ආයතන ස්වාධීනව සහ සාධාරණව ක්‍රියා කළ යුතු අතර, දේශපාලන බලපෑම්වලින් තොරව ඕනෑම ක්‍රියාමාගර්යක් සඳහා ලිඛිත සහ විනිවිද පෙනෙන හේතු ඉදිරිපත් කරමින් නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය.

- මාධ්‍යවේදියෙකුට හෝ මාධ්‍ය ආයතනයකට එරෙහි ඕනෑම චෝදනාවක් නිසි නීතිමය මාගර් හරහා මිස අවිධිමත් පීඩනයන්, ප්‍රසිද්ධ තජර්න හෝ තෝරාගත් බලාත්මක කිරීම් හරහා සිදු නොකළ යුතුය.

- මාධ්‍ය නිදහස ප්‍රායෝගිකව ආරක්ෂා කරන බවටත්, ස්වාධීන වාතර්ාකරණයට එරෙහිව බිය ගැන්වීමට හෝ පළිගැනීමට රාජ්‍ය ආයතන යොදා නොගන්නා බවටත් ඔබගේ කායර්ාලය විසින් පැහැදිලි ප්‍රසිද්ධ උපදෙසක් නිකුත් කළ යුතුය.

වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම සහ වෘත්තීය විෂමාචාරයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව අපි පිළිගනිමු. කෙසේ වෙතත්, ඒ සඳහා ගනු ලබන පිළියම් නීත්‍යානුකූල, සාධාරණ, සියල්ලන්ට සමානව අදාළ

වන සහ අධිකරණ අධීක්ෂණයට යටත් ඒවා විය යුතුය. අප දැන් දකින්නේ වැරදි තොරතුරුවලට එරෙහි ප්‍රතිපත්තියක් නොව, මදර්නය ඉලක්ක කරගත් දේශපාලන උපාය මාගර්යකි.

අතිගරු ජනාධිපතිතුමනි, මෙම රටාව දිගින් දිගටම පැවතුනහොත් එය ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පිළිගැනීමට සහ ආථර්ික විශ්වාසයට හානි කරනවා පමණක් නොව, සමාජ බෙදීම සහ මහජන කෝපය තවදුරටත් ගැඹුරු කරනු ඇත. ඉදිරියේදී සිදුවන මාධ්‍ය බිය ගැන්වීමේ ඕනෑම සිදුවීමක් හිතාමතා සිදුකරන ප්‍රජාතන්ත්‍රවාදී පසුබෑමක් ලෙස සවර්ජන බලය සලකන අතර, එවැනි ක්‍රියාවන්ට එරෙහිව දේශපාලනිකව, පාලරීමේන්තු මට්ටමින් සහ මහජනතාව සමඟ එක්ව හැකි සෑම පියවරක්ම ගන්නා බව දන්වා සිටිමු.

දැන් පවතින්නේ තීරණාත්මක මොහොතකි. රජය රජය විසින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රමිතීන් ආරක්ෂා කළ යුතුය, නැතහොත් ඒවා විනාශ කිරීමේ වගකීම රජය විසින් භාර ගත යුතුය. මෙම ගමන් මග වහාම වෙනස් කරන ලෙස අපි ඔබ තුමන්ගෙන් ඉල්ලා සිටිමු.

මෙයට විශ්වාසී,

රන්ජන් සෙනෙවිරත්න

මහ ලේකම්

සවර්ජන බලය

**පිටපත්:**

1. ජනාධිපති ලේකම්
2. මහජන ආරක්ෂක අමාත්‍ය
3. පොලිස්පති
4. සභාපති, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
5. සභාපති, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව